## ශිෂ්‍ය වාර්තාව කියවන්නේ කෙසේද

එක් එක් ඇගයුම් විෂය පථයක් වෙනුවෙන් ශිෂ්‍යයෙකු විසින් ලබා ගන්නා ලද ප්‍රතිඵල ඇගයුම් පරිමාණයකට අනුව පෙන්නුම් කරනු ලැබේ.

3, 5, 7 සහ 9 වසර වල සාක්ෂරතාව සහ සංඛ්‍යා හැකියා ඇගයුම් 1 වන තීරුවේ සිට 10 වන තීරුව දක්වා විහිදෙන පරිමාණයක වාර්තා කෙරේ. මෙම සාධන පරිමාණයෙන් නිරූපණය කරන්නේ ඇගයුම් වලදී ප්‍රදර්ශනය කල නිපුණතා සහ අවබෝධතා ඉහළ යෑමේ මට්ටම්ය.

උදාහරණයක් ලෙස, 3 වසරේ ප්‍රතිඵල වාර්තා කෙරෙන්නේ 1 වන තීරුවේ සිට 6 වන තීරුව දක්වා විහිදෙන පරාසයකය.




ශිෂ්‍යයෙකුගේ ප්‍රතිඵල දැක්වෙන්නේ මෙතන නම්, එයින් අදහස් වන්නේ එම ප්‍රතිඵලය 3 වසර ශිෂ්‍යයන්ගෙන් අපේක්ෂිත සාධන මට්ටමට වඩා ඉතා ඉහල බවයි.

තිතක් මගින් යම් ශිෂ්‍යයෙකුගේ පෞද්ගලික ප්‍රතිඵලය පෙන්නුම් කරනු ලැබේ.

කළු ත්‍රිකෝණය මගින් 3 වසර ශිෂ්‍යයන්ගේ ජාතික සාමාන්‍යය පෙන්නුම් කරනු ලැබේ.

ලා පැහැති පෙදෙසෙන් පෙන්නුම් කරනු ලබන්නේ ඔස්ට්‍රේලියාවේ 3 වසර ශිෂ්‍යයන්ගේ මධ්‍ය 60% ප්‍රතිශතයේ සාධන පරාසයයි.

1 තීරුවේ ප්‍රතිඵල ලැබූ 3 වසර ශිෂ්‍යයන් සිටින්නේ ජාතික අවම ප්‍රමිතියට පහළිනි.

## වැඩිදුර තොරතුරු

ඔබේ දරුවාගේ ප්‍රතිඵල ගැන වැඩිදුර තොරතුරු ලබා ගැනීමට සහ සාකච්ඡා කිරීම සඳහා ඔබේ දරුවාගේ ගුරුවරයා හෝ පාසලේ විදුහල්පති අමතන්න.

NAPLAN ප්‍රතිඵල සහ වාර්තා ගැන වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා ජාතික ඇගයුම් වැඩසටහනේ (National Assessment Program) වෙබ් අඩවියට www.nap.edu.au පිවිසෙන්න.

acara AUSTRALIAN CURRICULUM ASSESSMENT AND REPORTING AUTHORITY
www.acara.edu.au

NAP NATIONAL ASSESSMENT PROGRAM
www.nap.edu.au

# NAPLAN 2011

## ජාතික ඇගයුම් වැඩසටහන

### සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියාව

### දෙමාපියන් සඳහා ශිෂ්‍ය වාර්තා තොරතුරු



Sinhalese

State Government Victoria
VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY

## ජාතික ඇගයුම් වැඩසටහන — සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියා (NAPLAN) විභාග

මේ වසරේ මැයි මාසයේදී මුළු ඔස්ට්‍රේලියාව පුරා සිටින 3 වෙනි, 5 වෙනි 7 වෙනි සහ 9 වෙනි වසර ශිෂ්‍යයන් සඳහා ජාතික සාක්ෂරතාවය සහ සංඛ්‍යා හැකියා විභාග පවත්වන ලදී. ඔස්ට්‍රේලියාව පුරා පාසල් 10,000 ක පමණ මිලියනයකට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් මෙම ජාතික විභාග වලට සහභාගි වූහ. ඔබේ දරුවාගේ NAPLAN වාර්තාව ඔබට දරුවා කුසලතාවය දක්වන ආකාරය පෙන්වනු ලැබේ :

- ඔස්ට්‍රේලියාවේ අනෙක් ශිෂ්‍යයන් සමග සසඳා බැලීමෙන්
- ජාතික අවම ප්‍රමිති ආශ්‍රිතව

පසුගිය NAPLAN වාර්තා බැලීමෙන් ඔබේ දරුවාගේ කාලාන්තර සාධනය ගැන යම්කිසි අවබෝධයක් ලබා ගැනීමට හැකි නමුදු, මෙම ප්‍රතිඵල යොමු වනුයේ එක කාල ලක්ෂ්‍යයක් සඳහා පමනක් බැවින් එයින් දරුවාගේ පූර්ණ හැකියා පරාසය පිළිබිඹු නොකෙරෙන බවට අවධානය යොමු කල යුතුය. 2011 වසරේදී ප්‍රරෝචන ලිවීම සඳහා අලුත් පරිමාණයක් ස්ථාපනය කරන ලදී. මෙය මීට කලින් තිබුන වෘත්තාන්ත ලිවීම සඳහා වූ පරිමාණය සමග සැසඳෙන්නේ නැත.

## NAPLAN විභාග මගින් ඇගයුම් කෙරෙන්නේ මොනවාද?

සාක්ෂරතා විභාග මගින් මනිනු ලබන්නේ ශිෂ්‍යයාගේ කියවීම, ලිවීම සහ භාෂා ව්‍යවහාර (අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ සහ විරාම ලකුණු) සාධනයයි. සංඛ්‍යා හැකියා පරීක්ෂණ මගින් මනිනු ලබන්නේ ශිෂ්‍යයාගේ සංඛ්‍යා, වීජ ගණිතය, ශ්‍රිතය සහ රටාව, මිනුම, සම්භාවිතාව සහ දත්ත, සහ අවකාශය පිළිබඳ සාධනයයි.

## NAPLAN විභාග කිරීමේ අරමුණ

පාසලේ, පද්ධතියේ සහ ජාතික මට්ටම් වල NAPLAN ප්‍රතිඵල අධ්‍යාපන වැඩසටහන්වල ශක්තීන් සහ දුර්වලකම් හඳුනාගැනීම පිනිසත් වැඩසටහන් වැඩිදියුනු කිරීම සඳහා ඉලක්ක පිහිටුවීම සඳහාත් භාවිතා කරනු ලැබේ. පන්ති කාමරයේදී NAPLAN ප්‍රතිඵල මගින් ගුරුවරුන්ට තම ශිෂ්‍යයන්ගේ සාධනය ඔස්ට්‍රේලියාව හරහා පුළුල් ශිෂ්‍ය සමූහයක් හා සසඳා පෙන්වනු ලැබේ. පුද්ගලික ශිෂ්‍ය වාර්තා ඔබේ දරුවාගේ සාධනය සහ ප්‍රගතිය පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් අතර සාකච්ඡා සඳහා පදනමක් ලෙස භාවිතා කල හැකිය.

මෙම ප්‍රතිඵල තුලින් පිළිබිඹු කෙරෙන්නේ එක් නිශ්චිත කාල වේලාවකදී එක් එක් ශිෂ්‍යයාගේ කුසළතාවය, පමණක් බව මතක තබා ගැනීම වැදගත්ය. සෑම පාසලකම ගුරුවරු තම ශිෂ්‍යයන්ගේ සාක්ෂරතා සහ සංඛ්‍යා හැකියා ඉගෙනුම අඛණ්ඩව ඇගයුම් කරති. NAPLAN විභාග මගින් ගුරුවරුන් විසින් රැස් කරන තොරතුරු ඌණපූරණය කරනු ලබනවා මිස එම තොරතුරු ආදේශ කිරීමක් එමගින් සිදු නොකෙරේ.

## පාසැල් වාර්තා

පාසල් වල NAPLAN විභාග ප්‍රතිඵල සාමාන්‍යය, ජාතිකව සැසඳිය හැකි ආකාරයට My School වෙබ් අඩවියේ (www.myschool.edu.au) වාර්තා කරනු ලැබේ. මෙම වෙබ් අඩවිය දෙමාපියන්ට සහ ප්‍රජා සාමාජිකයන්ට පාසල් වැඩිදියුණු කිරීම සඳහා දැනුමැති විකල්ප සහ තීරණ වලට එළඹීමට තොරතුරු ලබා දෙයි.

My School වෙබ් අඩවිය ගැන වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර 1300 895 563 අංකය මගින් හෝ info@myschool.edu.au ඊමේල් ලිපිනය මගින් ACARA අමතන්න.

## ශිෂ්‍යයන්ගේ පුද්ගලික වාර්තා

NAPLAN ශිෂ්‍ය වාර්තා වල ආකෘතිය ඔස්ට්‍රේලියාවේ සෑම ප්‍රාන්තයක් සහ සන්තක ප්‍රදේශයකටම එක සමාන වන අතර එය සකස් කර ඇත්තේ මුලු රටේම ශිෂ්‍ය සාධනය දෙමව්පියන් සහ රැකවරණකරුවන් වෙත වාර්තා කිරීම පිණිසය.

සෑම වාර්තාවකම පහත දේ ඇතුලත් වේ :

- ශිෂ්‍යයා සහ පාසැලේ විස්තර
- NAPLAN විභාග ගැන තොරතුරු
- ශිෂ්‍ය වාර්තාව කියවන්නේ කෙසේද යන්න ගැන තොරතුරු
- NAPLAN සාධන පරිමාණයට අනුව කියවීම, ප්‍රරෝචන ලිවීම, භාෂා සම්මතයන් සහ සංඛ්‍යා හැකියා සඳහා ශිෂ්‍යයා ලබාගත් සාධන ප්‍රතිඵල
- සෑම ඇගයුම් පථයකටම අදාල ජාතික සාමාන්‍යය සහ මධ්‍යම 60% ප්‍රතිශතයේ ප්‍රතිඵල පෙන්වන දර්ශකයක්
- එක් එක් ඇගයුම් පථයක් සඳහා අගයන ලද්දේ කුමන නිපුණතාද යන්න හැඳින්වෙන ලිඛිත විස්තරයක්
- එක් එක් තීරුව මගින් ශිෂ්‍යයන් ප්‍රදර්ශනය කිරීමට ඉඩ ඇති නිපුණතාවන් විස්තර කෙරෙන වගුවක්

## ශිෂ්‍යයන්ගේ පුද්ගලික වාර්තාව කියවීම

ඔබේ දරුවාගේ ප්‍රතිඵලය සෑම ප්‍රස්තාරයකම කළු තිතකින් නිරූපනය කෙරේ. එම තිත තබා ඇති එක් එක් තීරුව හා සම්බන්ධ නිපුණතා එම වාර්තාවේ පසු පිටෙහි විස්තර කෙරේ. ශිෂ්‍යයෙකුගේ ඇගයීම කිසියම් තීරුවක දක්වා ඇති විට එම ශිෂ්‍යයා එම තීරුවට, සහ ඊට පහතින් ඇති සෑම තීරුවකටමත් අදාල නිපුණතා හා සම්බන්ධ ප්‍රශ්න වලට නිවැරදිව පිලිතුරු දී ඇති බව පෙන්වයි. ඔබේ දරුවාගේ ප්‍රතිඵලය ඔහුගේ හෝ ඇයගේ මට්ටමේ ඕස්ට්‍රේලියානු සිසුන්ගේ මධ්‍ය 60% ප්‍රතිශතය සමග/හෝ ජාතික සාමාන්‍ය අගය සමග සැසඳිය හැකිය.

## ඇගයුම් පරිමාණ සහ ජාතික අවම ප්‍රමිති

සෑම NAPLAN ඇගයුම් පරිමාණයකින්ම 3 වෙනි වසර සිට 9 වෙනි වසර දක්වා ශිෂ්‍යයා ලද සාධනය, තීරු දහයකට බෙදන ලද පොදු පරිමාණයක් හරහා විස්තර කෙරෙ. තීරු තුලින් පෙන්වනුයේ NAPLAN මගින් අගයන ලද නිපුණතා වල වැඩිවන සංකීර්ණතාවයයි. එක් එක් වසර මට්ටමේදී ශිෂ්‍යයා ලද සාධනය වාර්තා කිරීම සඳහා මෙයින් තීරු හයක් භාවිතා කරනු ලැබේ.

සෑම වසර මට්ටමකදීම එක් තීරුවක් ජාතික අවම ප්‍රමිතීන් ආවරණය කරන අතර එමගින් තම සුවිශේෂ පාසල් වසරේදී ශිෂ්‍යයන්ට පොදු වශයෙන් ප්‍රදර්ශනය කිරීමට පුළුවන් සමහර හැකියාවන් සහ අවබෝධතා විස්තර කෙරේ. ශිෂ්‍යයන් 3 වෙනි වසර සිට 9 වෙනි වසරට ප්‍රගමණය වීමේදී මුහුන දෙන වැඩිවන අභියෝගයෙන් යුත් හැකියා සහ අවබෝධකම් මෙමගින් නිරූපනය වේ. ඔබේ දරුවාගේ ප්‍රතිඵලය මෙම තීරුවේ ඇත්නම්, මෙම ප්‍රතිඵලය ඔබේ දරුවාගේ පාසල සමග සාකච්ජා කරන ලෙස නිර්දේශ කරනු ලැබේ.

- 3 වසර සඳහා අවම ප්‍රමිතිය 2 වන තීරුවයි
- 5 වසර සඳහා අවම ප්‍රමිතිය 4 වන තීරුවයි
- 7 වසර සඳහා අවම ප්‍රමිතිය 5 වන තීරුවයි
- 9 වසර සඳහා අවම ප්‍රමිතිය 6 වන තීරුවයි.

## NAPLAN ඇගයුම් පරිමාණ ප්‍රස්තාර නිදර්ශන

### 3 වසර කියවීම




කළු තිතෙන් පෙන්නුම් කරන්නේ මෙම 3 වසර ශිෂ්‍යයා කියවීම සඳහා 4 වන තීරුවේ, ජාතික සාමාන්‍යයට මදක් ඉහල, ප්‍රතිඵලයක් ලබා ඇති බවයි. කළු ත්‍රිකෝණයෙන් පෙන්නුම් කරන්නේ 3 වසර ශිෂ්‍යයන්ගේ ජාතික සාමාන්‍යයයි. මධ්‍ය 60% ප්‍රතිශතයේ සිටින 3 වසර ශිෂ්‍යයන්ගේ සාධන පරාසය ලා නිල් පෙදෙසෙන් පෙන්වයි.

### 5 වසර ලිවීම (ප්‍රරෝචන)




කළු තිතෙන් පෙන්නුම් කරන්නේ මෙම 5 වෙනි වසර ශිෂ්‍යයා ලිවීම (ප්‍රරෝචන) සඳහා ජාතික අවම ප්‍රමිතියට පහළ ප්‍රතිඵලයක් ලබා ඇති බවයි. මෙවන් ප්‍රතිඵල පාසැල සමග සාකච්ජා කිරීම යෝග්‍යයයි නිර්දේශ කෙරේ.

### 7 වසර සංඛ්‍යා හැකියාව




කළු තිතෙන් පෙන්නුම් කරන්නේ මෙම 7 වසර ශිෂ්‍යයා සංඛ්‍යා හැකියාව සඳහා 9 වන තීරුවේ, 7 වසරේ ශිෂ්‍යයන්ගේ ජාතික සාමාන්‍යයට සහ බහුතර සංඛ්‍යා හැකියා ප්‍රතිඵල වලට වඩා ඉතා ඉහල ප්‍රතිඵලයක් ලබා ඇති බවයි.